# දිළිඳු බව යනු කුමක් ද?

නිදහස ලබාගත් දින සිට මෙතෙක් ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක කරන ලද ආර්ථික සංවර්ධන ක්‍රමෝපායන් පදනම් වූයේ ආර්ථික වර්ධනය වේගවත් කිරීම හා සමාජ සුභ සාධන සේවාවන් ඉහළ මට්ටමකින් පවත්වාගෙන යාම සඳහායි. මේ නිසා සෞඛ්‍ය හා අධ්‍යාපනය වැනි මූලික අවශ්‍යතා සම්පූර්ණකර ගැනීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකාව අනෙකුත් දියුනු වෙමින් පවත් නා රටවලට සාපේක්ෂව ඉදිරියෙන් සිටියත් දිළිඳුකම පිටුදැකීම පිළිබඳ ප්‍රශ්නය තවමත් නොවිසඳී පවතී. රටේ ජනගහනයෙන් අඩකටත් වැඩි පිරියක් අන්ත දුගී භාවයෙන් පෙලෙන අතර ඔවුනගේ මාසික ආදායම මසකට රුපියල් හත් සියකටත් අඩු ය. බොහෝදෙනා ආහාර, නිවාස, හා ජලය වැනි සිය මූලික අවශ්‍යතාවයන් සපුරා ගැනීමේ අපහසුතාවයකට පත්ව ඇති අතර විරැකියාව මන්ද පෝෂණය, නොසන්සුනාවය හා ප්‍රචණ්ඩකාරී තත්ත්වයන් එහි අතුරු ඵල වශයෙන් රටෙහි ඇති වෙමින් පවතී. ඒ නිසා දිළිඳුකම නැති කිරීම ආර්ථික සංවර්ධන ප්‍රතිපත්තිවල ඉතාම වැදගත් අංගය විය යුතු බව ට නව රජය විසින් අවධාරණය කර ඇත.

සංවර්ධනයේ ප්‍රතිලාභ නිසි පරිදි ගලා නොයෑම හා භෞතික සම්පත්වල ඌණ භාවය නිසා සාගින්නෙන් හෝ මන්ද පෝෂණයෙන් පෙලෙන දුප්පතුන් විශාල පිරිසක් රටතුළ විසිරී සිටිති. බොහෝ විට මොවුන් සුළු අධ්‍යාපනයක් ලැබ හෝ කොහෙත් ම නොලැබ ජන කොටස් වන අතර ඉතා කටුක දිවි පෙවතක් ගෙවති. මූලික අවශ්‍යතාවන් වන නිවාස, ඇඳුම් පැළඳුම් හා ජලය සපුරා ගැනීමට අවශ්‍ය මිල දී ගැනීමේ හැකියාව ඉතා අඩු නිසා බොහෝ විට සාමාන්‍ය දිවි පැවතුම් හා සිරිත් විරිත් වලින් පවා ඈත් වී සිටිති. මේ නිසා ග්‍රාමීය දිළිඳු බව ඉතා සංකීර්ණ වන අතර එහි තීව්‍රභාවය භෞතික, සමාජ, ආර්ථික, දේශපාලනික, සංස්කෘතික හා ආයතනික කරුණු මත වෙනස් විය හැක. මෙසේ දුගීකම පළාත් වශයෙන් මෙන් ම ග්‍රාමීය නාගරික හා වතු අංශ වශයෙන් ද වෙනස් විය හැකි වුවත් දුගීකම පිළිබඳ ප්‍රශ්නය රට පුරා එකසේ පැතිර පවතී.

දුප්පත්කම නිරපේක්ෂ වශයෙන් මෙන් ම සාපේක්ෂ වශයෙන් ද මැනිය හැකිය. මිනිසාට ජීවත් වීමේ දී අවශ්‍ය මූලික අවශ්‍යතාවන් වන ආහාර, නිවාස, ජලය, ආදී සම්පත් එක් එක් පුද්ගලයා ලබා ගන්නා ආකාරය සොයා බැලීමෙන් නිරපේක්ෂ වශයෙන් දිළිඳුකම මැනිය හැකි අතර මිනිසා ජීවත් වන සමාජයේ පවත්නා ආදායම් මට්ටම් හා එහි විෂමතා සලකා බැලීමෙන් සාපේක්ෂ වශයෙන් දිළිඳුකම මැනිය හැකිය. මේ කුමන ආකාරයකින් මැන බැලුවත් දිළිඳුකම ශ්‍රී ලංකාවේ ඉතා උග්‍ර ප්‍රශ්නයක් වී ඇති නිසා ශ්‍රී ලංකව ලොව ඉතාමත් දිළිඳු රටවල් වලින් එකක් ලෙස සැලකුම් ලබයි.

පසුගිය දශක කිපය තුල දී ශ්‍රී ලංකාවේ ඒක පුද්ගල ආදායම සංඛ්‍යාත්මක වශයෙන් තරමක් ඉහල ගියත් මූර්තමය වශයෙන් එහි අගය පිරිහී ඇති බව පෙනේ. 1982 දී ඇමෙරිකානු ඩොලර් 320 ක් වූ ඒක පුද්ගල ආදායම 1987 අග භාගයේ දී ඇමරිකානු ඩොලර් 340 දක්වා වැඩි විය. මෙම කාල පරිච්ඡේදයේ දී කොළඹ පාරිභෝගික මිල දර්ශනය 416 සිට 652 දක්වා වැඩි වී ඇත. ලෝක ආරක්ෂණ වාදය. අපනයන මිල පහල වැටීම, විදේශාධාර මත යැපීම, ගෙවුම් ශේෂ හිඟය, රුපියලේ අගය පහල වැටීම හා භාණ්ඩ හා සේවා මිල ඉහල යෑම මීට ප්‍රධාන හේතු විය. වගු අංක 1 න් පෙන්නුම් කරන පරිදි ශ්‍රී ලංකාවේ ඉතාමත්ම දුප්පත් අයගේ ඒක පුද්ගල ආදායම 1969/70 සිට 1980/81 දක්වා කාලපරිච්ඡේදයේ දී ඉහළ යෑමක් පෙන්නුම් කලත් දිළිඳු මට්ටමට පහල ජන කොටස් 18% සිට 22.5% දක්වා ඉහල නැග ඇති බව පෙනේ. ග්‍රාමීය අංශයේ මෙම වැඩිවීම තරමක් ඉහලය.

වගු අංක 1. ජනගහනයේ අනුපාතයක් වශයෙන් ශ්‍රී ලංකාවේ දිළිඳු ජන ප්‍රමාණය

| වර්ෂය | දිළිඳු මට්ටමේ ඒක පුද්ගල ආදායම මසකට/රු: | දිළිඳු මට්ටමට පහළ ජනගහනය(%) | ග්‍රාමීය අංශයේ ප්‍රතිශතය | මූලයන් |
|---|---|---|---|---|
| 1969/70 | | 18.0 | --- | කොළඹ ක්‍රම කාර්යාලය (1979) |
| 1973 | 36.50 | 13.0 | 17.6 | මාර්ග ආයතනය (1982) |
| 1980/81 | 80.00 | 22.5 | 25.6 | ජන හා සංඛ්‍යා ලේඛණ දෙපාර්තමේන්තුව (1983) |

මූලය: ග්‍රාමීය ආසියාවේ දුප්පත්කම නැති කිරීමේ උපක්‍රම; ලෝක කම්කරු සංවිධානය: (1985). පිටුව 245.

සැම විනුම දණ්ඩක් මගින්ම ශ්‍රී ලංකාවේ දිළිඳුකම සම්බන්ධයෙන් හෙලි කරන මූලික ලක්ෂණ කිහිපයකි. ඉතා පහත් ඒක පුද්ගල ආදායමක් ලැබීම, ඉඩම් කැබලි වීම හා ඉඩම් නොමැතිකම, ශරීරයට අවශ්‍ය කැලරි ප්‍රමාණය අඩුවීම, සේවා වියුක්තිය, ආදායම් විෂමතාවය හා රජයේ හා පෞද්ගලික අංශයේ සේවාවන් උපයෝජනය කිරීමට මහ ජනයා දක්වන මන්දොත්සාහය මෙහි දී වැදගත් කරුනු වේ.

ඉඩම් කැබලිවීම හා ඉඩම් නොමැතිකම දිළිඳුකමේ සුවිශේෂ ලක්ෂණයකි. ශ්‍රී ලංකාවේ ජනගහනයෙන් 65% ක් පමණ සුළු ගොවීන් වන අතර ඔවුන් යැපුම් මට්ටමේ ජීවත්වෙන අඳ ගොවීන්, කෘෂිකාර්මික කම්කරුවන්, හා හවුල් ගොවීන් වශයෙන් කොටස් කළ හැකි සුළු ගොවීන්ගේ නිෂ්පාදන තත්ත්වය ඉතාමත් අසතුටුදායක බව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුනුකිරීමේ ආයතනය කරන ලද සමීක්ෂණ වලින්

වගු අංක 2: ඉඩම් ප්‍රමාණය අනුව ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික ඉඩම් භාවිතය 1980/81 වර්ෂය.

| ප්‍රමාණය (අක්කර) | අයිති ප්‍රමාණය % | සාමාන්‍ය ඉඩම් ප්‍රමාණය |
| --- | --- | --- |
| 1/2ට අඩු | 30.2 | 0.18 |
| 1/2 — 1ට අඩු | 15.2 | 0.16 |
| 1 — 2ට අඩු | 19.3 | 1.26 |
| 2 — 3ට අඩු | 11.4 | 2.26 |
| 3 — 10 දක්වා | 21.0 | 9.96 |
| 10 ට ඉහල | 2.9 | 23.46 |

මූලය : ජන හා සංඛ්‍යා ලේඛණ දෙපාර්තමේන්තුව

හෙළි වී ඇත. වගු අංක 2 ට අනුව මුළු ජනගහනයෙන් 78% ක් අක්කර 3 ට අඩු ඉඩම් හිමියන් වන අතර ඔවුන්ට හිමිවී ඇත්තේ වගා බිම් වලින් 37.8% ක් පමනි. මුළු ජනගහනයෙන් පහෙන් දෙකක් ම අක්කර 1 ට අඩු අය වන අතර ඔවුන්ගේ සාමාන්‍ය ඉඩම් අයිතිය අක්කර 0.37 ක් පමණ වේ. එසේ ම ඉඩම් නොමැති අයගේ ප්‍රතිශතය ද ක්‍රමයෙන් ඉහළ යන තිබෙන අතර මුළු ජනගහනයෙන් 11 % කට කිසිම ඉඩමක අයිතිය නොමැති බව 80/81 සමාජ හා ආර්ථික සමීක්ෂණ වාර්තාවෙන් හෙළි කරයි.

ශ්‍රී ලංකාවේ ජනගහනය ලබා ගන්නා ඒක පුද්ගල කැලරි ප්‍රමාණය සැලකිල්ලට ගැනීම ද දිළිඳුකම මැනීමේ නිර්නායකයකි. ජාත්‍යයන්තර ප්‍රමිතීන්ට අනුව පුද්ගලයෙකු ජීවත් කරවීම සඳහා අවශ්‍ය අවම කැලරි ප්‍රමාණයවත් නො ලබන විශාල ජන කොටසක් රට තුළ විසිරී සිටින බව 1980/81 සමාජ හා ආර්ථික සමීක්ෂණයෙන් පෙන්නුම් කෙරිනි. ශරීරයට අවශ්‍ය කැලරි හා ප්‍රෝටීන් හීනතාවය නිසා මන්ද පෝෂණය හා ලෙඩ රෝග වලට භාජනය වීමේ ප්‍රවනතාවය වැඩි විය හැක. ශ්‍රී ලංකාවේ මාතෘ හා ළදරු මන්දපෝෂණය උග්‍රව ඇති බව ශ්‍රී ලංකා වෛද්‍ය පර්යේෂණ ආයතනයේ වාර්තා වලින් හෙළි වී ඇත. වගු අංක 3 න් පෙන්නුම් කරන පරිදි ග්‍රාමීය හා නාගරික අංශවල ජනතාවගෙන් විශාල කොටසක් ශරීරයට නියමිත කැලරි හා ප්‍රෝටීන් ප්‍රමාණය ලබා නොගන්නා බව පෙන්නුම් කරයි.

කෘෂිකාර්මික හා කෘෂිකාර්මික නො වන කම්කරුවන්, සුළු ගොවීන්, අඳ ගොවීන්, හවුල් ගොවීන් හා ඉඩම් නොමැති පිරිස් ප්‍රධාන වශයෙන් ශ්‍රී ලංකාවේ දිළිඳු කොටසට අයත් වේ. ප්‍රධාන වශයෙන් කෘෂි කාර්මික කටයුතු මත යැපෙන මෙම ජන කොටස් ග්‍රාමීය ණය ගැති භාවයෙන් පීඩා විඳිති මොවුන්ගේ කෘෂිකාර්මික ඵලදායිතාවය ඉතා අඩු අතර නව කෘෂි තාක්ෂණ යෙදවුම් භාවිතය කෙරෙහි දක්වන්නේ අඩු නැඹුරුවකි. මෙයට මූලික හේතුවක් වී ඇත්තේ ආයතනික කෘෂි සේවාවන් උපයෝජනය කිරීම කෙරෙහි සුළු ගොවීන් දක්වන උනන්දුව මඳවීමයි. ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය මගින් කල සමීක්ෂණ වලින් හෙළි වූයේ මෙවැනි සුළු ගොවීන් සංවිධානය වී නොසිටීම ආයතනික කෘෂි සේවාවන් නිසි පරිදි උපයෝජනය නො කිරීමට හේතුවක් වී ඇති බවයි. වගු අංක 4 න් පෙන්නුම් කරන පරිදි අක්කර 1 ට අඩු සුළු ඉඩම් හිමියන් ආයතනික අංශයෙන් ණය ලබා ගැනීම කෙරෙහි කිසිම උනන්දුවක් දක්වා නොමැති අතර අක්කර 3 ට වැඩි ගොවීන් අක්කර 1–3 දක්වා ගොවියන්ට වඩා සැලකිය යුතු ප්‍රතිචාරයක් දක්වා ඇති බව පෙනේ. මෙහි ප්‍රතිඵලය වූයේ බොහෝ සුළු ගොවීන් ආයතනික නොවන අංශයන් ඉහල පොලී අනුපාතයකට ණය ගැනීමට පෙළඹීමයි. මුදල් වලින් මෙන් ම කෘෂිකාර්මික භාණ්ඩ වලින් ද පොලී ගෙවන මෙවැනි ගොවීන් 200% ක් පමණ අධික පොලියට ද ණය ලබා ගෙන ඇති බව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ සමීක්ෂණ වල දී අනාවරණය වී ඇත.

සේවා වියුක්තිය හෙවත් ශ්‍රම බල කායෙන් විශාල පිරිසකට රැකියා නොමැතිකම හෝ සුදුසු රැකියා නො ලැබීයාම ද දිළිඳුකම සම්බන්ධයෙන් කැපී පෙනෙන ලක්ෂණයකි, සේවා වියුක්තිය සම්බන්ධ සංඛ්‍යා ලේඛණ අනුව ශ්‍රී ලංකාවේ මුළු ජනගහනයෙන් 20% කට වැඩි ප්‍රමාණයක් විරැකියාවෙන් යුක්ත වන අතර ඌණ සේවා නියුක්තිය සලකතොත් මෙම ප්‍රමාණය 30% ද ඉක්මවා යයි. බොහෝ ග්‍රාමීය ප්‍රදේශ වල දිළිඳුකමට බලපෑ මූලිකම හේතුව වූයේ වැඩිවන ජනගහනයට සාපේක්ෂ රැකියා අවස්ථා වැඩි නො වීමයි. විරැකියාව නිසා මතු වී තිබෙන බරපතලම ප්‍රශ්නය වී ඇත්තේ තරුණ අසහනයයි. එය විවිධ සමාජ අපගමනකාරී ක්‍රියාවන් ඇති වීම කෙරෙහි විශාල බලපෑමක් කර ඇත.

19 පිටුවට

වගු අංක 3 : ශ්‍රී ලංකාවේ ජනගහනය ලබා ගන්නා කැලරි හා ප්‍රෝටීන් ප්‍රමාණය (ප්‍රතිශතයක් වශයෙන්)

| | වර්ෂය | ප්‍රමාණවත් ලෙස කැලරි හා ප්‍රෝටීන් නොලබන කුටුම්බනන්ගේ ප්‍රතිශත | |
| --- | --- | --- | --- |
| | | කැලරි | ප්‍රෝටීන් |
| ග්‍රාමීය අංශය | 1969/70 | 36.3 | 45.5 |
| | 1980/81 | 50.0 | 35.3 |
| වතු අංශය | 1969/70 | 31.7 | 44.5 |
| | 1980/81 | 43.0 | 38.1 |
| නාගරික අංශය | 1969/70 | 19.7 | 19.5 |
| | 1980/81 | 33.0 | 28.3 |

මූලය: ග්‍රාමීය ආසියාවේ දුප්පත්කම නැති කිරීමේ උපක්‍රම: ලෝක කම්කරු සංවිධානය; (1985) පිටුව 246.

වගු අංක 4 : කෘෂිකර්ම ඉඩම් අයිතිය අනුව වගා ණය ලබා ගැනීම.

| ඉඩම් අයිතිය (අක්කර) | ආයතනික අංශයේ ණය ලබා ගන්නේ ප්‍රතිශතයක් වශයෙන් |
|---|---|
| අක්කර 1 ට අඩු | 0 |
| 1 – 3 දක්වා | 33 |
| 3 ට වැඩි | 46 |

මූලා: ශ්‍රී ලංකාවේ ග්‍රාමීය දිළිඳුකම හා ආදායම් විෂමතාවය'' ලෝක කම්කරු සංවිධානය හා අර්ථෙප් ආයතනය, (1984) පිටුව 256

විෂම ආදායම් ව්‍යාප්තිය ශ්‍රී ලංකාවේ දිළිඳුකම ගෙන දෙන ඉතා හොඳ නිර්නායකයකි. ලංකාවේ දිළිඳුකම ව්‍යාප්ත වීමට බලපෑ ප්‍රධාන හේතුවක් වී ඇත්තේ ද විෂම ආදායම් ව්‍යාප්තිය බව ශ්‍රී ලංකා මහ බැංකුව මගින් කරන ලද පාරිභෝගික මූල්‍ය සමීක්ෂණ වාර්තා වලින් පෙන්නුම් කරයි. ආදායම් විෂමතාවය මනින ගිනි අනුපාතය 1963 සිට 1978/79 දක්වා කාල පරිච්ඡෙදයේ දී 0.44 සිට 0.49 දක්වා වැඩි වීමක් පෙන්නුම් කර ඇත. 1970 ගණන් වලදී කරන ලද ඉඩම් ප්‍රතිසංකරණ කටයුතු නිසා ගිනි අනුපාතයේ සැලකිය යුතු පහළ යාමක් පෙන්නුම් කලත් 1977 න් පසු ක්‍රියාත්මක කල විවෘත ආර්ථිකයේ බලපෑම නිසා නැවතත් එහි සීඝ්‍ර ඉහළ නැගීමක් පෙන්නුම් කරයි. ඉහළ ආදායම් ලබන 20% පිරිස මුළු ජාතික ආදායමෙන් අඩකට වඩ කියන අතර අඩුම ආදායම් ලබන 20% කොටසට හිමි වන්නේ මුළු ජාතික ආදායමෙන් 5%ක් හෝ ඊටත් අඩුවෙන් බව වගු අංක 5 න් පෙන්නුම් කරයි.

ක්‍රියාත්මක කිරීම, විශාල පරිමාණයේ කෘෂිකාර්මික ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, කෘෂි ආයතනික ප්‍රතිපත්ති වෙනස් කිරීම ඉඩම් ප්‍රතිසංස්කරණ හා ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීම මෙහි දී දුගීකම අඩු කිරීම සඳහා ක්‍රියාත්මක කල සුවිශේෂ ප්‍රතිපත්ති වශයෙන් හඳුන්වා

ගොවිකටයුතු
පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ
පර්යේෂණ හා පුහුණු කිරීමේ නිලධාරි

## මහින්ද හේනේගෙදර

විසිනි

දිය හැකිය. මෙම ප්‍රතිපත්ති ප්‍රධාන වශයෙන් දුගීකම තුරන් කිරීම මත පදනම් නොවුවත් එයින් අපේක්ෂා කරනු ලැබුවේ ආර්ථික වර්ධනය සමග දුප්පත්කම තුරන් කිරීමයි. මෙවැනි ප්‍රතිපත්ති වලින් කෘෂිකාර්මික පලදාව ඉහළ දැමීම, ග්‍රාමීය සංවර්ධන හා සෞඛ්‍ය අධ්‍යාපනය වැනි අංශයන් දියුණුවීම කෙරෙහි විශාල බලපෑමක් කලේ ය. විශේෂයෙන් ආහාර මුද්දර

වගු අංක 5 : ආදායම් කණ්ඩායම් අනුව ජාතික ආදායම බෙදී යන ආකාරය.

| ආදායම් කණ්ඩායම් | | 1963 | 1973 | 1978/79 |
|---|---|---|---|---|
| අවම කණ්ඩායම | 20% | 3.60 | 5.35 | 3.49 |
| දෙවැනි කණ්ඩායම | 20% | 8.75 | 11.60 | 8.60 |
| තෙවැනි කණ්ඩායම | 20% | 14.18 | 16.95 | 14.11 |
| හතරවැනි කණ්ඩායම | 20% | 22.08 | 23.29 | 20.82 |
| ඉහළ කණ්ඩායම | 20% | 51.39 | 42.27 | 52.98 |
| ගිනි අනුපාතය | | 0.44 | 0.37 | 0.48 |

මූලය: පාරිභෝගික මූල්‍ය සමීක්ෂණ වාර්තා - ශ්‍රී ලංකා මහ බැංකුව.

නිදහස ලැබීමෙන් පසු බලයට පත් වූ සෑම රජයක් මගින්ම පසුගිය දශක 4ක පමණ කාලසීමාව තුල ශ්‍රී ලංකාවේ දුගීකම පිටු දැකීම සඳහා විවිධ ක්‍රමෝපායන් හා ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරනු ලැබීය. රාජ්‍ය සුභසාධක සේවාවන්

සහනාධාරය. සෞඛ්‍ය හා අධ්‍යාපන සහන සේවා නිසා විශාල දුගී පිරිසක් යැපුම් මට්ටමේ ගෝ රඳවා ගැනීමට හැකි විය. එහෙත් ආර්ථික සංවර්ධනය වේගවත් කිරීම සඳහා 1977 න් පසු, ක්‍රමයෙන් මෙම සහනාධාරයන් අඩු

කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් දුගීකම පිළිබඳ ප්‍රශ්නය ක්‍රමයෙන් උග්‍රවිය. මෙලෙස ශ්‍රී ලංකාවේ දුගීකම ඇතිවීම හා එහි ව්‍යාප්තිය කෙරෙහි බලපෑ ප්‍රධාන කරුණු කිපයක් කෙටියෙන් සඳහන් කල හැකිය.

1. දුගීකම නැතිකිරීම සඳහා ක්‍රියාත්මක කල ප්‍රතිපත්ති මූලික වශයෙන් දිළිඳුබව පිටුදැකීම පරමාර්ථ කර ගෙන සකස් නොවීම හා රටේ ඉතාමත් දිළිඳු කොටස් කවුරුන්ද යන්න නියමාකාරව හඳුනා නොගැනීම.
2. සියළුම ආර්ථික ප්‍රතිපත්ති ඉහල සිට පහලට ක්‍රියාත්මක කලා විනා ''සහභාගිත්වය සංවර්ධනය'' වැනි ආර්ථික සංවර්ධන ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ දී ඉතා දිළිඳු කොටස්වල සහභාගිත්වය නොගැනීම.
3. වර්ධනය සමග බෙදී යාම යන සංකල්පය මත ප්‍රතිපත්ති සකස් නොවීම.
4. බොහෝ සංවර්ධන ව්‍යාප්ති නාගරික ප්‍රදේශවලට විශේෂ අනුග්‍රහයක් දක්වමින් ක්‍රියාත්මක කිරීම.

මේ නිසා දිළිඳුබව පිටු දැකීම පිළිබඳ ප්‍රශ්නය ඉතා සංකීර්ණ ප්‍රශ්නයක් බවට පත් වී ඇති අතර ඒ හේතුවෙන් විවිධ අතුරු ප්‍රශ්න වර්තමානයේ පැන නැගෙමින් පවතී. මන්ද පෝෂණය ඉහල යාම, විරැකියාව, තරුණ අසහනය හා සමාජ නොසන්සුන් තාවය දුගීකම ව්‍යාප්ත වීමෙන් ඇති වූ අතුරු ප්‍රතිපල වශයෙන් සැලකිය හැක. මේ නිසා සියළු ආර්ථික සංවර්ධන ප්‍රතිපත්තිවල ප්‍රමුඛතාවය දුගීකම තුරන් කිරීම මත පදනම් විය යුතුව ඇත. එය දුප්පත් ජනතාවගේ සහභාගිත්වය ඇති ව ක්‍රියාත්මක කල යුතු අතර පළමුව සමාජයේ දිළිඳුම කොටස් වලට ප්‍රමුඛත්වය දිය යුතු ය. එහෙත් මෙහි දී සැලකිල්ලට ගත යුතු වඩාත් වැදගත්ම කාරණය වන්නේ කිසියම් මුදල් සහනාධාරයක් දුගී පවුල් වලට ලබා දීමෙන් රජය මත යැපෙන පිරිසක් ඇති කිරීමට වඩා ජාතික නිෂ්පාදන ක්‍රියාවලියට දුප්පතුන්ගේ ක්‍රියාකාරිත්වය දායක කල හැකි රටට වැඩදායි ප්‍රතිපත්ති ඇති කිරීමයි. මෙහි දී ''ස්වශක්තිය'' පිළිබඳ අදහස ඉතා වැදගත් වන අතර මේ සඳහා නිසි අවබෝධයක් ලබා දීම අවශ්‍යයෙන් ම කල යුතු කාර්යයකි.